රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි :- 3/2003

මගේ අංකය : II 576 E 16 (II) (තාව)
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2003.10.08

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## රාජ්‍ය නිලධාරීන්ට වන්දි ප්‍රතිලාභ ගෙවීම

1988.07.13, 1989.11.30 සහ 1993.09.21 දිනැති අංක 21/88, 59/89 සහ 22/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට ඔබේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 හි 1 ඡේදයෙන් පැහැදිලි කෙරෙන හේතුන් නිසා රජයේ නිලධාරීන්ට මුහුණ පෑමට සිදුවන අනතුරු සම්බන්ධයෙන්, එම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි වන්දි ලබා ගත හැක.

03. රාජකාරියේ යෙදී සිටින අවස්ථාවකදී ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් තුවාල ලබන රාජ්‍ය නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/88 හි විධිවිධාන අනුව වන්දි ගෙවීමට හැක.

04. 1989.11.30 දිනැති අංක 59/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන්, ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා සහ කඩාකප්පල්කාරී ක්‍රියා හේතුවෙන් සිදුවන තුවාල හෝ මරණ සහ රාජකාරියේ යෙදී සිටියදී හෝ නොසිටියදී සිදුවන තුවාල හෝ මරණ වෙනුවෙන් ද රජයේ නිලධාරීන්ට වන්දි ගෙවීමේ විධිවිධාන සලසා ඇත. අංක 22/93 සහ 21/88 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ දෙකෙහි දක්වා ඇති ප්‍රතිලාභ දෙකම, එක් නිලධාරියකුට ලබාගත **නොහැකි** බවත්, නිලධාරියකුට අයිතිය ඇත්තේ වඩාත් වාසිදායක වූ **එක්** ප්‍රතිලාභයක් ලබා ගැනීමට පමණක් බවත් අංක 59/89 චක්‍රලේඛයේ 3 ඡේදයෙන් පැහැදිලිව දක්වා ඇත.

05. මෙම උපදෙස් උල්ලංඝනය කරමින් ඇතැම් නිලධාරීන්ට මෙම චක්‍රලේඛ දෙකින්ම සලසා ඇති සහන ලබා දී ඇති බවට පැමිණිලි මා වෙත ලැබී ඇත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 59/89 හි විධිවිධාන තරයේ පිළිපැදිය යුතු බව මින් අවධාරණය කරමි.



එස්.සී.මාන්නප්පෙරුම
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය